# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2185/3 – 2020 ජූලි 20 වැනි සඳුදා – 2020.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මරුමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/BNT/2018/330 හා 2018.06.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – මොරකැටිය වත්ත නොහොත් මිල්ලගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0253**

උතුරට: එච්. ටී. ඩී. එල්. කමලාංගනී හිමිකම් කියන මිල්ලගහවත්ත සහ ජී. ඒ. එච්. එස්. කුමාර හිමිකම් කියන මිල්ලගහවත්ත; නැගෙනහිරට: පඩිපෙල, එම්. යූ. ඩී. කුලසේන හිමිකම් කියන මිල්ලගහවත්ත සහ එම්. ඩී. රණසිංහ හිමිකම් කියන මිල්ලගහවත්ත; දකුණට: එම්. ඩී. රණසිංහ හිමිකම් කියන මිල්ලගහවත්ත, ජී. ඒ. රේඩින් හිමිකම් කියන මිල්ලගහවත්ත, මාර්ගය සහ එච්. ටී. ඩී. එල්. කමලාංගනී හිමිකම් කියන මිල්ලගහවත්ත; බටහිරට: එච්. ටී. ඩී. එල්. කමලාංගනී හිමිකම් කියන මිල්ලගහවත්ත.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/5/2018/HA/56.
2020 මැයි මස 26 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 08